**කටුවන ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6 (අ), (ඒ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු කොම්පෝස්ට් අංගනය සංවර්ධනය වෙනුවෙන් ඉකුත් වර්ෂයකදී වැයකර තිබූ රු.3,697,048 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රු.666,459 ක් වූ පුනරාවර්ථන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කිරම බස් නැවතුම්පොළෙහි තීන්ත ආලේප කිරීම සඳහා ඉකුත් වර්ෂයකදී දරන ලද රු.662,772 ක වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුය. |
| (ඈ) | 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බදුදී තිබූ කඩ කාමර නැවත සභාවට භාරදී / පවරාගෙන තිබියදී බදුකරුවන්ගෙන් අයකර තිබූ රු.509,300 ක තෙමස් ඇප තැන්පතුව වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාළ තැන්පත්කරුවන් දැනුවත් කර ඉදිරියේදී නිවැරදි කරන බව. | තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 19 ක එකතු වටිනාකම රු.456,694 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී සභාවේ මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැයකර තිබූ රු. 281,250 ක වටිනාකම අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | අස්පෘශ්‍ය වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු. 98,604 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ එකතුව රු.81,750 ක් වූ කබඩ් 03 ක් හා පොත් රාක්කය ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව සභාවට නොලැබෙන ඉකුත් වර්ෂයන්ට අදාළ රු.7,063,745 ක මුද්දර ගාස්තු ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සභාව සතු වාහන 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තා ලද පසු ගිණුම් ගතකරන බව. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134 (1) වගන්තිය | සභාව විසින් 2014 වර්ෂයේදී දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගත් වසම් 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | එකතුව රු. 29,110 ක් වූ මාස 06 ඉක්ම වූ චෙක්පත් 08 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආදායකයින් දැනුවත් කර ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,814,836 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,119,979 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 1,265,150 | 1,583,055 | 1,592,385 | 10,560 | 1,156,630 | 1,147,780 | 1,133,890 | 19,890 |
| කුලී | 15,736,200 | 14,201,599 | 13,977,834 | 2,100,898 | 15,143,900 | 10,525,336 | 10,373,436 | 1,877,133 |
| බලපත්‍ර ගාස්තු | 1,461,350 | 2,278,420 | 2,531,220 | 221,500 | 1,527,050 | 1,693,532 | 1,751,432 | 474,300 |
| වෙනත් ආදායම් | 25,379,060 | 28,595,523 | 25,914,250 | 13,315,755 | 59,025,060 | 24,062,757 | 23,612,764 | 10,634,482 |
| **එකතුව** | 43,841,760 | 46,658,597 | 44,015,689 | 15,648,713 | 76,852,640 | 37,429,405 | 36,871,522 | 13,005,805 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර තුන ඉක්මවා ඇති කඩ කාමර කුලී රු.210,276 ක්, ටෙන්ඩර් දේපල තුනකින් අයවිය යුතු කුලී රු.90,750 ක් සහ වාහන කුලියට දීමෙන් අයවිය යුතු කුලී රු.747,840 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට සහ නිත්‍යානුකූල කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස් (දකුණු)ගේ චක්‍රලේඛය අනුව ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී බඳුදී තිබූ කඩ කාමර 12 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.10,364,333 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ එක්වන් මුදල් අයකර ගැනීමට සහ රු.8,450,000 ක එක්වන් මුදල සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් මත කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 05 කින් ලැබිය යුතු රු. 209,000 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි. | 2019 වර්ෂයට අදාළ රු. 88,800 ක මුදල සඳහා නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ජල ගාස්තු රු. 12,330,075 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිඟහිටි ශේෂය තුළ වසර 01 ත් 03 ත් අතර හා 03 වැඩි ශේෂය පිළිවෙලින් රු. 1,892,542 ක් හා රු. 2,981,582 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ජල ගාස්තු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 22,567,025 ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 1,036,186 ක් ලද අතර ඉතිරි මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර ආයතන 11 ක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර එම ආයතන වලින් පරිසරයට වන බලපෑම පිළිබඳව සභාව විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අදාළ පාර්ශවයන් වෙත පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාදී පරිසරය සුරක්ෂිත කිරීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් 12 ක හා ගොඩනැගිලි 16 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය සභාව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තියට අනුකූල නොවන ලෙස එකතු වටිනාකම රු.3,344,030 ක් වූ භාණ්ඩ වර්ග 07 ක් මිලදීගෙන තිබුණි. තවද මෙම මිලදීගැනීමෙහි ඇතුලත් එකතු වටිනාකම රු.1,220,390 ක් වූ මිලදීගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විස්තරාත්මක පිරිවිතර සඳහන් කර මිල ගණන් කැඳවීමට සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර අදාළ මිලදී ගැනීම් සිදු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 06 කට අදාළව මාර්ගය කැපීම සඳහා ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීමේදී යාන්ත්‍රික රේටයක් භාවිතා නොකර හස්ත රේටයක් භාවිතා කර තිබීම නිසා රු.965,067 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රු.198,973 ක් රඳවුම් මුදලින් අයකර ගැනීමට සහ මෙම කර්මාන්ත වලට අදාළ ඇස්තමේන්තුවට වඩා නිමකළ ප්‍රමාණය වැඩි නිසා වැඩිපුර ගෙවීමක් සිදුකර නොමැති බව. | වැඩිපුර ගෙවා මුදල් සම්බන්ධයෙන් මු.රෙ. 156 අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | හොරේවෙල ගොරක මුදුන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා පස් සපයා ගොනු කිරීමේ කාර්යය සඳහා යොදාගත යුතු නිවැරදි රේටය යොදා නොගෙන හා පස් ගොනුකර නොතිබියදී පස් ගොනු කිරීම වෙනුවෙන් රු. 96,725 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවා මුදල් සම්බන්ධයෙන් මු.රෙ. 156 අනුව කටයුතු කළයුතුය. |
| (ඇ) | කටුවන ජාතික පාසලේ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා එහි දැල් වැටක් ඉදිකිරීම, හියුම් පයිප්ප බෝක්කුවක් දැමීම, ක්‍රීඩාංගනයේ පස් පිරවීම, දුර පැනීමේ ඒකකය ඉදිකිරීම, කවපෙත්ත විසි කිරීමේ ඒකකය ඉදිකිරීම සහ කොන්ක්‍රීට් කානුව ඉදිකිරීම යන කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට රු.4,155,080 කට පවරාදී පසුව මුළු ඇස්තමේන්තු මුදලම භාවිතා කර | ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම නිශ්ඵල ක්‍රියාවක් බවට පසුව හඳුනාගෙන මුළු ඇස්තමේන්තු වටිනාකම යොදාගෙන පස් පිරවීම සඳහා පෙර කොන්ත්‍රාත්කරු වෙතම කොන්ත්‍රාත්තුව ලබා දුන් අතර නැවත ටෙන්ඩර් කිරීමට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර පස් කැනීම් කිරීම සඳහා රජය විසින් අවසර ලබාදී ඇති ලියාපදිංචි ස්ථානයකින් පස් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රීඩා පිටියේ පස් පිරවීම පමණක් සිදුකර රු. 4,963,605 ක් ගෙවීම් කර තිබුණි. | කටයුතු නොකළ අතර ක්‍රීඩා පිටියේ අතුරන ලද පස් පෞද්ගලික ඉඩමකින් ලබාගත් බව. | |
| (ඈ) | හෙල්ලල කසල අංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා මිල විචලනයන් ගෙවීම් කිරීමට 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතු වුවත්, එසේ නොතිබියදී රු.71,975 ක් මිල විචලනයන් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ උපදෙස් අනුව ගෙවීම් කළ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | කොන්ක්‍රීට් කැටගල් අල්ලා සංවර්ධනය කරනු ලැබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 06 කට අදාළව මිලිමීටර් 37.5 ප්‍රමාණයේ ගල් සැපයීම හා ප්‍රවාහනය වෙනුවෙන් රු.1,497,995 ක් ගෙවීම් කර තිබූ නමුත්, එහිදී ගල් සම්පිණ්ඩනතා සංගුණකය නියමිත ප්‍රතිශතයට නොමැති බව නිරීක්ෂණය විය. | ග්‍රාමීය මාර්ග ක්‍රියාත්මක කිරීමට අදාළ පොදු උපදෙස් ලිපිය පරිදි අතුරන ලද කැටගල් වල සියයට 95 ත් 100 ත් අතර සම්පීඩ්‍යතාවය පැවති බව. | නියමිත සම්පීඩ්‍යතා ප්‍රතිශතයට අනුව අතුරන ලද කැටගල් සම්පිණ්ඩනය වී තිබිය යුතුය. |
| (ඊ) | මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා නිවැරදි රේටයක් යොදගෙන ඇස්තමේන්තු සකස් නොකර ගෙවීම් කිරීම මත රු.587,113 ක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබීම අයකර නොගැනීම. | කියුබික් මීටර 200 අඩු අවස්ථා වලදී හස්ත රේටයන් භාවිතා කිරීම ගැටලුවක් නොවන බව. | වැඩිපුර ගෙවන ලද මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී සේවය හැරගිය නිලධාරියෙක්ගෙන් ලැබිය යුතු ආපදා ණය රු. 159,236 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇපකරුවන් දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |